# නිපුනතාවය 15

## පිරිවැය හැසිරීම හා පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණය තුළින් කළමනාකරණ තීරණ ගැනීමේ ක්‍රියාවලියට දායක වෙයි.

<u>කළමනාකරණ තීරණ ගැනීම.</u>

කළමණාකරන කාර්යයේ මූලික අංග හතරකි.

- සැලසුම් කිරීම.
- සංවිධානය.
- මෙහෙය වීම.
- පාලනය.

මෙහිදී කළමනාකරුවෙකු විසින් සැලසුම් සකස් කර ඒවා ක්‍රියාත්මක කිරීමේදී විවිධ තීරණ ගැනීමට සිදුවේ. කළමනාකරණ තීරණ ප්‍රධාන ආකාර දෙකකි.

- කෙටිකාලීන තීරණ
- දිගුකාලීන තීරණ

එලෙස තීරණ ගැනීමේදී කෙටිකාලීන තීරණ ගැනීම සඳහා භාවිතා කරන ශිල්පීය ක්‍රමයකි, පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණය.

යම් කිසි තීරණයක් ගැනීමට පෙර එම තීරණ ගැනීම තුළින් වාසියක් සිදුවේද? අවාසියක් සිදු වේද? අදාළ කාර්යයට දරන පිරිවැය ආවරණය කර ගන්නේ කෙසේද? වැනි ගැටලු විමසා බැලීමත් පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණය දී සිදුවේ.

උදාහරණ:

- දැනට කරගෙන යන ව්‍යාපාරයක නව සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී (නව භාණ්ඩයක් හඳුන්වාදීමේ දී )
- කිසියම් උත්සවයක් සංවිධානය කිරීමේ දී
- කිසියම් වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමේදී
- චාරිකාවක් සංවිධානය කිරීමේදී
- කිසියම් අධ්‍යාපන පාඨමාලාවක් ආරම්භ කිරීමේදී වැනි

ඉහත කී අවස්ථාවල කළමනාකරුවන්ට/ සංවිධායකයින්ට පහත ගැටලු මතුවිය හැකිය.

- ලාභයක් /අතිරික්තයක් ලැබේද?
- පිරිවැය ආවරණය කර ගන්නේ කෙසේද?
- අපේක්ෂිත ලාභයක් ලබා ගන්නේ කෙසේද?
- මිල ගනන් වෙනස්වීම මත ඇතිවන නව තත්ත්වයන් කෙසේ සිදුවේද?

ඉහත කී ගැටළු වලට පිළිතුරු පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණය තුළින් ලබාගත හැකිය.

පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණයේ දී ඒකකයක් සමඟ ( භාණ්ඩයක් /සේවාවක්) පිරිවැය හැසිරෙන ආකාරය අනුව පිරිවැය වර්ග කරගත යුතුයි. ඒ අනුව ප්‍රධාන පිරිවැය වර්ග දෙකක් පිරිවැය හැසිරීම අනුව හඳුනාගත යුතුය.

- විචල්‍ය පිරිවැය
- ස්ථාවර පිරිවැය

පිරිවැය හැසිරීම අනුව වර්ගීකරණය කිරීමේදී භාවිතා කරන නිර්ණායක.

| විචල්‍ය පිරිවැය | ස්ථාවර පිරිවැය |
|---|---|
| නිෂ්පාදනය කරන / අලෙවිකරණ ඒකක සමඟ සමානුපාතිකව වෙනස්වීම.<br><br>උදාහරණ<br><br><u>ලී බඩු නිපදවන ආයතනයක</u><br>ලී වල පිරිවැය<br>වඩු කාර්මික වැටුප (කෑලි ක්‍රමයට ගෙවන) | නිෂ්පාදනය කරන අලෙවිකරණ ඒකකය සමඟ සමානුපාතික නොවීම.<br><br><u>ලී බඩු නිපදවන ආයතනයක</u><br>• යන්ත්‍ර ක්ෂය<br>• කම්හල් කුලී |
| නිෂ්පාදනය / අලෙවිය ශූන්‍යයේදී විචල්‍ය පිරිවැය ශූන්‍ය වීම.<br><br>උදාහරණ<br><br>ඉහත ලී වල පිරිවැය හා වඩු කාර්මික වැටුප ලී බඩු නිපදවා නැතිනම් ශූන්‍යකි. | නිෂ්පාදනය / අලෙවිය ශූන්‍යයේදී දරා ඇත.<br><br>ඉහත යන්ත්‍ර ක්ෂය හා කම්හල් කුලී, නිපදවීම හෝ අලෙවිය ආරම්භ කර නැතත් දරා ඇත. |

පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණයේ දී භාවිතයට ගන්නා උපකල්පන:

ඉදිරි අනාගත කාලයේ ගැනීමට නියමිත තීරණයකට අදාළ බැවින් සියලුම පිරිවැය හා ආදායම් ඇස්තමේන්තු ලෙස ලබා ගනී. ඒ අනුව උපකල්පන පහත පරිදි හඳුනා ගත යුතුය.


- පිරිවැය ස්ථාවර හා විචල්‍ය යනුවෙන් පමණක් වෙන් කිරීම.
- ස්ථාවර පිරිවැය කෙටි කාලයේදී වෙනස් නොවන බව.
- ආයතනය නිපදවන්නේ එක් භාණ්ඩයක් පමණක් බව.
- තාක්ෂණය හා ශිල්පීය ක්‍රම වෙනස් නොවන බව.
- මුළු ආදායම් හා මුළු පිරිවැය රේඛා සරල රේඛාවක් බව.
- ආදායම් හා පිරිවැය වෙනස් වීමට බලපාන එකම සාධකය පරිමාව පමණක් බව.

මෙලෙස උපකල්පනය කිරීමට හේතුව තීරණ ගැනීමට නම් ආදායම් හා වියදම් වෙනස් නොවී පැවතිය යුතු වීමයි. ප්‍රායෝගිකව එලෙස නොවුවත් කෙටිකාලීන තීරණ ගැනීමේදී වෙනස් නොවන බව උපකල්පනය කරයි.

පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණය තීරණය ගැනීමට භාවිත කරන ආකාරය පැහැදිලි කර ගැනීමට සරල උදාහරණයක් භාවිතා කරමු.


අම්ල රටකජු මිලට ගෙන ඒවා පැකට් කර අලෙවි කිරීමට “අම්ල බයිට්ස්” ව්‍යාපාරය 2023 වසරේදී ආරම්භ කිරීමට සැලසුම් කර ඇත. අදාළ පිරිවැය පහත පරිදි වේ.

| | |
|---|---|
| රටකජු පැකට් එකක අපේක්ෂිත විකුණුම් මිල | රු.100 |
| පැකට් එකක නිෂ්පාදන විචල්‍ය පිරිවැය | රු.40 |
| පැකට් එකක් අලෙවි කිරීමේදි විකුණුම් කොමිස් | රු.20 |
| නිෂ්පාදන ස්ථාවර පිරිවැය | රු.400 000 |
| නිෂ්පාදන නොවන ස්ථාවර පිරිවැය | රු.200 000 |
| අපේක්ෂිත අලෙවි පැකට් ගණන | රු.20 000 |






පීස්තාරික නිරූපනය


මුලු විචල්‍ය පිරිවැය




මුලු ස්ථාවර පිරිවැය



පැවරුම් අභ්‍යාස :

- ඇඟළුම් කර්මාන්තශාලාවක
- බේකරි ආයතනයක
- වාණිජ සංගමය මගින් අලෙවි කිරීමට අපේක්ෂිත ටී ෂර්ට් එකක
- වාණිජ සංගමය මගින් යැමට සැලසුම් කර ඇති චාරිකාවක පිරිවැය

සිසුන් කණ්ඩායම් කර ඉහත ආකාරයට වර්ග කිරීමට පැවරීම.

පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණය දී භාවිතයට ගන්නා සංකල්ප.

1. දායකය/ සහභාගය
2. දායක විකුණුම් අනුපාතය/ ලාභ පරිමා
3. සමච්ඡේද ලක්ෂය
4. ලාභය/ අතිරික්තය
5. ආන්තික පිරිවැය ආදායම් ප්‍රකාශය.
6. අපේක්ෂිත ලාභය
7. ආරක්ෂිත ආන්තිකය
8. සංවේදිතා විශ්ලේෂණය

ගණනය කළ හැකි ආකාර දෙකකි.

- සමීකරණ ආශ්‍රයෙන්
- ප්‍රස්තාරික ක්‍රමයට

ඉහත "අමිල බයිට්ස්" ව්‍යාපාරයේ තොරතුරු ආශ්‍රයෙන් ඉහත සංකල්ප පැහැදිලි කර ගනිමු.

රට කජු පැකට් එකක විකුණුම් මිල රු. 100/=
විචල්‍ය පිරිවැය රු. 60/=
මුළු ස්ථාවර පිරිවැය රු.600000/=
අපේක්ෂිත අලෙවි ඒකක ගණන පැකට් 20000

<u>සමීකරණ ඇසුරෙන් ගණනය කිරීම්</u>

1. දායකය / සහභාගය : ආදායම හා විචල්‍ය පිරිවැය අතර වෙනසයි. මෙය ඒකකයක දායකය හෝ මුළු දායකය ලෙසටද ගණනය කළ හැක.


I. ඒකකයක දායකය = ඒකකයක විකුණුම් මිල - ඒකකයක විචල්‍ය පිරිවැය
= 100-60
= <u>රු.40</u>

II. මුළු දායකය (a) = ඒකකයක දායකය* අපේක්ෂිත අලෙවි ඒකක ගණන
= 40* 20000
=<u>රු.800000/=</u>

(b) = මුළු ආදායම - මුළු විචල්‍ය පිරිවැය

= (100*20000) –(60*20000)
= 2000000 – 1200000
= රු.800000/=

දායකයේ / සහභාගයේ වැදගත්කම




- මේ අනුව දායකයේ වැදගත්කම වන්නේ දායකය තුළ ලාභය අන්තර්ගත වීමයි.
- කෙටි කාලයේදී ස්ථාවර පිරිවැය වෙනස් නොවන බැවින් දායකය වැඩි වන විට ලාභය වැඩි වේ .

ලාභ පරිමා අනුපාතය / දායක විකුණුම් අනුපාතය

විකුණුම් වලට දායකය දක්වන අනුපාතය මෙයින් විස්තර කරයි. නැතහොත් දායකය විකුණන මිලෙහි ප්‍රතිශතයක් ලෙස ඉදිරිපත් කිරීම මෙහිදී සිදුවේ.

දායක විකුණුම් අනුපාතය (a) $= \frac{\text{ඒකකයක දායකය}}{\text{ඒකකයක විකුණුම් මිල}} * 100$

$= \frac{40}{100} * 100$

$= 40\%$

(b) $= \frac{\text{මුළු දායකය}}{\text{මුළු ආදායම}} * 100$

$= \frac{800000}{2000000} * 100$

$= 40\%$

මෙහි අදහස විකුණුම් මිල = දායකය + විචල්‍ය පිරිවැය
100 = 40 + 60 වන බවයි .

සමච්ඡේද ලක්ෂය (BEP)

ආදායම පිරිවැයට සමාන වන අවස්ථාව නැතහොත් ලාභ අලාභ නොමැති අවස්ථාව මෙයින් අදහස් කරයි.

I. සමච්ඡේද ලක්ෂ ඒකක ගණන = <u>මුළු ස්ථාවර පිරිවැය</u>
ඒකකයක දායකය
= <u>600000</u>
40
= <u>15000 ඒකක</u>

ii. සමච්ඡේද ලක්ෂා ආදායම/ වටිනාකම

(a) = සමච්ඡේද ලක්ෂ ඒකක ගණන * එකක අලෙවි මිල

= 15000*100

= <u>රු.1500000</u>

(b) = <u>මුලු ස්ථාවර පිරිවැය</u>

ලාභ පරිමා අනුපාතය

= <u>600000</u>

40%

= <u>රු.1500000</u>

සමච්ඡේද අවස්ථාවේ ආදායම පිරිවැයට සමාන වන බව ඔප්පු කිරිම.

| | |
|---|---|
| ආදායම | = මුලු පිරිවැය |
| (15000*100) | = මුලු විචල්‍යය පිරිවැය+ මුලු ස්ථාවර පිරිවැය |
| 1500000 | = 15000* 60 |
| 1500000 | = 900000 + 600000 |
| 1500000 | = 1500000 |

සමච්ඡේද අවස්ථාවේ විශේෂ ලක්ෂණ,

- මුළු ආදායම = මුළු පිරිවැය
- ලාභ අලාභ නොමැතිවීම
- මුළු ස්ථාවර පිරිවැය = මුළු දායකය

  600000 = (40*15000)

  600000 = 600000

- ඒකකයක දායකය = ඒකකයක ස්ථාවර පිරිවැය

40 = <u>600000</u>

15000

40 = 40

ආරක්ෂිත ආන්තිකය

අපේක්ෂිත අලෙවිය හා සමච්ඡේද අලෙවිය අතර වෙනස. එනම් වර්තමාන ධාරිතා මට්ටමේ සමච්ඡේදන ලක්ෂයක් අතර පරාසය හෙවත් සමච්ඡේදන ලක්ෂය ඉක්මවා ඇති විකුණුම් මෙයින් විස්තර කරයි.

I. ආරක්ෂිත ආන්තික ඒකක ගණන = අපේක්ෂිත අලෙවි ඒකක ගණන - සමච්ඡේද ඒකක ගණන
= 20000 – 15000
= <u>5000ඒකක</u>

ii. ආරක්ෂිත ආන්තික වටිනාකම (a) = ආරක්ෂිත ආන්තික ඒකක * ඒකකයක අලෙවි මිල

= 5000 *100

= <u>රු.500000</u>

(b) = මුළු ආදායම - සමච්ඡේද ලක්ෂ්‍ය ආදායම
= 20000*100 – 15000*100
= 2000000 – 1500000
=<u>රු. 500000</u>

ලාභය හෝ අලාභය සෙවීම.

ආන්තික පිරිවැය කරණයේදීද ලාභය හෝ අලාභය යනුවෙන් අදහස් වන්නේ ආදායම හා වියදම අතර වෙනසයි. නමුත් මෙහි ඇති විශේෂත්වය වන්නේ මේ සඳහා පදනම් කරගනු ලබන්නේ විචල්‍යය පිරිවැය හා ස්ථාවර පිරිවැයයි. ඒ අනුව මුළු ආදායමෙන් විචල්‍යය පිරිවැය ඉවත් කොට දායකය ගණනය කර ඉන් ස්ථාවර පිරිවැය ඉවත් කිරීමෙන් ලාභය ගණනය කරයි.

I. ලාභය/ අලාභය = මුලු දායකය - මුලු ස්ථාවර පිරිවැය
= (40* 20000) – 600000
= 800000- 600000
= <u>රු.200000</u>

ආන්තික පිරිවැය ආදායම් ප්‍රකාශය.

අදාළ ව්‍යාපාර කටයුත්තේ ලාභය හෝ අලාභය විචල්‍ය හා ස්ථාවර පිරිවැය භාවිතයෙන් ගණනය කිරීම සඳහා පිළියෙල කරනු ලබන ප්‍රකාශයයි.

ආන්තික පිරිවැය ආදායම් ප්‍රකාශය

| | |
|---|---|
| ආදායම | X |
| (-) විචල්‍යය පිරිවැය | (X) |
| දායකය | X |
| (-)ස්ථාවර පිරිවැය | (X) |
| ලාභය හෝ අලාභය | X |

ආදායම් ප්‍රකාශය මඟින්,

| | |
|---|---|
| මුලු ආදායම (100* 20000) | 2000000 |
| මුලු විචල්‍ය පිරිවැය (60* 20000) | (1200000) |
| මුලු දායකය | 800000 |
| මුලු ස්ථාවර පිරිවැය | (600000) |
| ලාභය | 200000 |

iii. ලාභය/අලාභය =ආරක්ෂිත ආන්තික වටිනාකම * ලාභපරිමා අනුපාතය

= (5000* 100) * 40/100

= 500000* 40/100

=රු.200000

iv. ලාභය/අලාභය =ආරක්ෂිත ආන්තික ඒකක ගණන * ඒකකයක දායකය

= 5000* 40

=රු.200000

අපේක්ෂිත ලාභය

කිසියම් ව්‍යාපාරික කටයුත්තකින් අපේක්ෂිත ලාභයක් ලබා ගැනීමට කොපමණ ඒකක ප්‍රමාණයක් අලෙවි කළ යුතුද ? නැතහොත් කොපමණ ආදායම් ඉපැයිය යුතු ද යන්න දුනා ගැනීමට ද පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණය යොදා ගත හැක.

I. අපේක්ෂිත ලාභයක් සඳහා විකුණුම් ඒකක ගණන = $\frac{\text{ස්ථාවර පිරිවැය + අපේක්ෂිත ලාභය}}{\text{ඒකක දායකය}}$

ඉහත අමිල බයිට්ස් ව්‍යාපාරය රු.400000 ක ලාභයක් ලැබීමට අපේක්ෂා කරයි නම් ,විකිණිය යුතු පැකට් ගණන සෙවිය හැක.

විකිණිය යුතු ඒකක ගණන = $\frac{600000 + 400000}{40}$

= 25000

II. අපේක්ෂිත ලාභයක් සඳහා විකුණුම් ආදායම = අපේක්ෂිත ඒකක ගණන * ඒකකයක විකුණුම් මිල

= 25000*රු.40

<u>රු.1000000</u>

නැතහොත් = $\frac{\text{ස්ථාවර පිරිවැය + අපේක්ෂිත ලාභය බෙදීම}}{\text{දායක විකුණුම් අනුපාතය}}$ ද භාවිතා කළ හැක.

විශේෂ කරුණු (ඉහත" අමිල බයිට්ස්" තොරතුරු ඇසුරින්)

| ඒකක ගණන | මුලුපිරිවැය<br>විචල්‍යය + ස්ථාවර<br>(10000*60) + 600000 | ලාභය/අලාභය<br>ආරක්ෂිත ආන්තික ඒකක ගණන * ඒකකයක දායකය<br>(-5000*40) |
|---|---|---|
| 10000 | 1200000<br>((15000*60) +600000) | (200000) |
| 15000 | 1500000<br>((20000*60) +600000) | 0<br>(5000*40) |
| 20000 | 18000000 | 200000 |

මෙලෙස තොරතුරු දී ඇති අවස්ථාවක ,

1. ඒකකයක විචල්‍යය පිරිවැය = $\frac{\text{මුලු පිරිවැය වෙනස}}{\text{ඒකක වෙනස}}$ $\frac{\Delta TC}{\Delta Q}$

ඒකක 15000 සහ 20000 අවස්ථාව

= $\frac{300000}{5000}$

=රු.60

2. ඒකකයක දායකය = $\frac{\text{ලාභයේ/අලාභ වෙනස}}{\text{ඒකක වෙනස}}$ $\frac{\Delta P/L}{\Delta Q}$

ඒකක
10000 සහ 20000
අවස්ථාව

$= \frac{400000}{10000}$

=රු.40


පිරිවැය පරිමා ලාභ විශ්ලේෂණය ට අදාළ ගණනය කිරීම් ප්‍රස්තාර ප්‍රවේශයෙන්. (ඉහත අමිල බයිට්ස් ව්‍යාපාරය ආශ්‍රයෙන්)

ප්‍රස්තාර තුනක් ඇත.


- සම්ප්‍රදායික සමච්ඡේද ප්‍රස්ථාරය
- දායක සමච්ඡේද ප්‍රස්ථාරය
- ලාභ පරිමා සටහන

උසස් පෙළ විභාගයේ දී දළ සටහන් ඇඳීම ප්‍රමාණවත් වේ.


1. සම්ප්‍රදායික සමච්ඡේද ප්‍රස්තාරය



2. දායක සමච්ඡේද ප්‍රස්තාරය




3. ලාභ පරිමා සටහන



සංවේදීතා විශ්ලේෂණය

ලාභය කෙරෙහි බලපෑමක් ඇති කරනු ලබන විචල්‍යයන්ගේ වෙනස් වීමක් මඟින් කරනු ලබන විශ්ලේෂණය සංවේදීතා විශ්ලේෂණයයි.

ඒ අනුව විකුණුම් මිල, ස්ථාවර පිරිවැය හෝ විචල්‍යය පිරිවැය වෙනස්වීමක් මඟින් ඇතිවන නව තත්ත්වයන් විශ්ලේෂණය කරයි.

ඉහත “අමිල බයිට්ස්” ව්‍යාපාරයේ තොරතුරු භාවිතා කරමු.

විකුණුම් මිල රුපියල් 10 කින් අඩු කළහොත් අලෙවි කිරීමට අපේක්ෂිත ඒකක ගණන 50% කින් ඉහළ යන බව අලෙවි කළමණාකරු පවසයි. නමුත් මෙහිදී රුපියල් එක්ලක්ෂ පනස් දහස150 000 ක අමතර ප්‍රචාරණ පිරිවැයක් දැරීමට සිදුවේ.

මෙම වෙනස්වීම් අනුව නව තත්වයන් විග්‍රහ කරමු.

| | පැරණි තත්ත්වය | නව තත්ත්වය BEP) |
|---|---|---|
| පැකට් ඒකක විකුණුම් මිල | රු.100 | රු.90 |
| පැකට් ඒකක විචල්‍ය පිරිවැය | රු.60 | රු.60 |
| ඒකක දායකය | රු.40 | රු.30 |
| ලාභ පරිමා අනුපාතය | 40% | 33.3% (30*100 / 90 |
| BEP ඒකක ගණන | = 600 000 / 40 | 750 000 / 30 |
| | 15000 ඒකක | 25000 ඒකක |

| | පැරණි තත්ත්වය | නව තත්ත්වය |
|---|---|---|
| BEP ආදායම | 15000*100 | 25000*9 |
| | රු.1500 000/= | රු.2250 000/= |
| අපේක්ෂිත අලෙවි ඒකක | 20 000 ඒකක | 30000 ඒකක (50%වැඩි) |

අපේක්ෂිත ලාභය = ආරක්ෂිත ආන්තික ඒකක * ඒකක දායකය

| | පැරණි තත්ත්වය | නව තත්ත්වය |
|---|---|---|
| | (20 000-15000)* 40 | (30 000-25000)* 30 |
| | 5000*40 | 5000*30 |

රු.200 000 රු.150 000

ඉහත තත්ත්වයන් මත එළඹිය හැකි නිගමනය වන්නේ විකුණුම් මිල අඩු කිරීම මගින් ව්‍යාපාරයට වාසිදායක තත්ත්වයක් ඇති නොවන බවයි.

අභ්‍යාස

(1) ඇතුගල්පුර විද්‍යාලයේ වාණිජ සංගමයට අරමුදල් සම්පාදනය කර ගැනීම සඳහා වේදිකා නාට්‍යයක් එක්දිනක් තුල දර්ශන වාර දෙකක් ප්‍රදර්ශනය කිරීමට යෝජනා ස්ථිර කරගෙන ඇත .

මේ සඳහා පත්කළ කමිටුව විසින් පහත තීරණ ගෙන ඇත.

- පැමිණෙන සෑම ප්‍රේක්ෂකයෙකු ටම මුව ආවරණයක් සහ දැත් පිරිසිදු කිරීමේ ද්‍රාවණ කුඩා බෝතලයක් නොමිලේ ලබාදීමට .
- ප්‍රභූ සුභාශිංශන ඇතුලත් සමරු කලාපයක් මුද්‍රණය කර ප්‍රේක්ෂකයෙකු ට එක බැගින් ලබා දීමට.

අපේක්ෂිත වියදම්

| | රු. |
|---|---|
| • නාට්‍ය කණ්ඩායමට එක් දර්ශන වාරයකට | 50000 |
| • සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරණ කටයුතු සඳහා | 10000 |
| • ශාලා කුලිය දිනකට | 30000 |
| • මුව ආවරණයකට | 100 |
| • දැත් පිරිසිදු කිරිමේ ද්‍රාවණ බෝතලයකට | 200 |
| • නාට්‍ය කණ්ඩායමට සංග්‍රහ වියදම් | 10000 |
| • ප්‍රවේශපත්‍ර මුද්‍රණ වියදම | 40000 |
| • සමරු කලාපයක මුද්‍රණ වියදම | 700 |

අනුග්‍රාහක දායකත්වයන්

- සමාජ මාධ්‍ය ඔස්සේ සිදුකරන ප්‍රචාරණ වියදම සහ ප්‍රවේශ පත්‍ර මුද්‍රණ වියදමෙන් අඩක් (50% ක්) සංගමයේ සාමාජිකයින් විසින් පෞද්ගලිකව දැරීමට කැමැත්ත පළ කර ඇත.
- ප්‍රවේශ පත්‍රයක් රුපියල් 1,500 ක ට අලෙවි කිරීමට තීරණය කරන ලදී .
- ශාලාවේ ආසන ගණන 1000ක් වන අතර 500 දෙනකු පැමිණේ යැයි අපේක්ෂා කෙරේ.

1. මෙම කටයුත්ත වෙනුවෙන් දැරීමට සිදු වන මුළු ස්ථාවර පිරිවැය කොපමණ ද ?
2. එක් ප්‍රේක්ෂකයෙකු වෙනුවෙන් දැරීමට සිදුවන විචලා පිරිවැය කොපමණ ද?
3. එක් ප්‍රේක්ෂකයෙකු ගේ දායකය හා දායක විකුණුම් අනුපාතය ගණනය කරන්න .
4. ලාභ හෝ අලාභ නොලබා සිටීමට අලෙවි කළ යුතු ප්‍රවේශපත්‍ර සංඛ්‍යාව සහ ඉපැයිය යුතු විකුණුම් ආදායම කොපමණ ද ?
5. ප්‍රවේශපත්‍ර 500ක් අලෙවි කිරීමට අපේක්ෂා කරයි නම්

- අපේක්ෂිත ලාභය සමීකරණය ඇසුරින් හා ආදායම් ප්‍රකාශය ඇසුරින්
- ආරක්ෂිත ආන්තික ඒකක ගණන හා වටිනාකම ගණනය කරන්න.

6. රු.200 000ක ලාභයක් ලැබීමට නම් විකිණිය යුතු ප්‍රවේශපත්‍ර ගණන හා විකුණුම් ආදායම කොපමණ ද?
7. පහත එකිනෙක අවස්ථා ස්වාධීන යැයි සලකා එක් එක් අවස්ථාවන්වල සමච්ඡේදන ලක්ෂය ගණනය කරන්න.
    - ප්‍රවේශ පත්‍රයක විකුණුම් මිල රුපියල් 2000 දක්වා වැඩි කළ විට.
    - ප්‍රවේශ පත්‍රයක විකුණුම් මිල රුපියල් 1200 ක් දක්වා අඩු කළ විට.
    - පිරිසිදු කිරීමේ ද්‍රාවණ බෝතලයක් ලබානොදීමට තීරණය කළ විට.
    - දැත් පිරිසිදු කිරිමේ ද්‍රාවණ බෝතලයක මිල රු.300ක් දක්වා ඉහළ ගිය විට.
8. ඉහත එකිනෙක අවස්ථාවන් වල ප්‍රවේශපත්‍ර 500ක් අලෙවි කිරීමේදී ලබන ලාභයට සිදුකරන බලපෑම දක්වන්න.

(2) මෑතකදී ඇති වූ ඉන්ධන අර්බුදය සමග පාපැදි සඳහා ඇතිවූ අධික ඉල්ලුම නිසා පාපැදි මිල අධික ලෙස ඉහළ ගිය අතර තම සංගමයට සාමාජිකයන් වැඩි කරගැනීමට මෙය මහඟු අවස්ථාවක් කරගත් “පා පැදි කරුවන්ගේ සංගමය” ජපානයෙන් පාපැදි ආනයනය කොට සහන මිලට ජනතාවට ලබා දීමට තීරණය කරන ලදී.

- මාස දෙකක් තුළ පාපැදි 300ක් ආනයනය කිරීමට ඔවුන් අපේක්ෂා කරයි.
- පාපැදියක් රු.10000ක් ලෙස මිල ලකුණු කර රු. 300 ක වෙළෙඳ වට්ටමකට යටත්ව අලෙවි කිරීමට අපේක්ෂා කරයි.
- අතිරික්තයක් වේ නම් සංගමයේ අරමුදලට එය එකතු කරගනී.
- අපේක්ෂිත පිරිවැය

- පාපැදියක ගැණුම් මිල රු. 7000
- පාපැදියක ට රේගු බදු රු.1000
- ආනයන බලපත්‍ර ගාස්තුව රුපියල් 60000
- අලෙවි නියෝජිතයා ගේ මාසික වැටුප රු.30000
- ප්‍රදර්ශනාගාරයේ මාසික කුලිය රු. 25,000
- ප්‍රවාහන වියදම් මුළු තොගයට ම රුපියල් 70,000
- පාපැදියක් අලෙවි කිරීමට නියෝජිතයාට රු. 500 ක කොමිස් මුදලක් ගෙවීම

1. පාපැදියක විචල්‍යය පිරිවැය
2. ශ්‍රම කටයුත්තේ මාස දෙක සඳහා මුළු ස්ථාවර පිරිවැය.
3. පාපැදියක විකුණුම් මිල
4. පාපැදියක දායකය
5. මුලු තොගයේ දායකය
6. අපේක්ෂිත ලාභය
7. සමච්ඡේදන ලක්ෂා පාපැදි ගණන
8. අපේක්ෂිත ආන්තික පාපැදි ගණන
9. විකුණුම් නියෝජිතයාට කොමිස් මුදලක් ගෙවීම වෙනුවට පාපැදියක් සමඟ රු. 700ක් වටිනා හිස්වැසුමක් ගැනුම්කරුවන්ට ලබාදීමට තීරණය කළහොත් සමච්ඡේදන පා පැදි ගණන
10. ඉහත දැරීමට අපේක්ෂා කළ වියදම් එලෙසම තිබියදී වෙළඳ වට්ටම රු.540 දක්වා වැඩි කිරීමට තීරණය කළහොත් සමච්ඡේදන පාපැදි ගණන

**01.** පිරිවැය - පරිමා ලාභ විශ්ලේෂණයේ මූලික අරමුණ

(1) නිශ්චිත කාර්ය මට්ටමක වෙනස්වීමක් ඇති වූ විට එය ලාභයට කෙසේ බලපාන්නේ ද යන්න සොයා බැලීමයි.

(2) සමච්ඡේදන ලක්ෂ්‍යය ගණනය කිරීම

(3) පිරිවැය පාලනය කිරීම

(4) නිශ්චිත කාර්ය මට්ටමක වෙනස්වීමක් ඇති වූ විට එය මුළු වත්කම්වලට බලපාන ආකාරය සොයා බැලීම.

(5) ඉහත කිසිවක් නොවේ.

**02.** පහත තීරණවලින් කුමකට පිරිවැය - පරිමා ලාභ විශ්ලේෂණය තුළින් විසඳුම් ලබා දෙන්නේ ද?

A - සමච්ඡේදන විකුණුම් පරිමාව කොපමණ ද?

B - අවශ්‍ය ලාභය ලබාගැනීමට තිබිය යුතු විකුණුම් ඒකක ගණන කොපමණ ද?

C - භාණ්ඩ ඒකක මිල වෙනස් කළ විට එය ලාභයට කෙසේ බලපාන්නේ ද?

D - භාණ්ඩ වර්ග කිහිපයක් නිපදවිය හැකි විට කුමක භාණ්ඩ නිෂ්පාදනය කළ යුතුද?

E - භාණ්ඩ නිෂ්පාදනය කරනවාට වඩා පිටතින් මිල දී ගැනීම කළ යුතු ද?

(1) ABC (2) BCD (3) CDE (4) ADE (5) ඉහත සියල්ලම

**03.** පිරිවැය - පරිමා ලාභ විශ්ලේෂණයේ උපකල්පනයක් නොවන්නේ,

(1) කෙටි කාලයේ දී මුළු පිරිවැය ස්ථාවර හා විචල්‍ය ලෙස වර්ග කළ හැකි බව

(2) ආයතනය නිපදවන්නේ එක් භාණ්ඩයක් පමණක් බව

(3) මුළු ආදායම හා මුළු වියදම් රේඛීය බව

(4) ලාභ ගණනය කරන්නේ දළ ලාභ පදනම මත බව

(5) විචල්‍ය පිරිවැය පරිමාව සමඟ ඍජුවම වෙනස්වන බවත් ස්ථාවර පිරිවැය නොවෙනස්ව පවතින බවත්

**04.** සහභාගය / දායකය සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය

(1) ඒකක දායකය යනු ඒකක විකුණුම් මිල හා ඒකක විචල්‍ය පිරිවැය අතර වෙනසයි.

(2) මුළු දායකය යනු මුළු විකුණුම් ආදායම හා මුළු විචල්‍ය පිරිවැය අතර වෙනසයි.

(3) ලාභ සමච්ඡේදනයේ දී ඒකක සහභාගය හා ඒකක ස්ථාවර පිරිවැය සමාන වේ.

(4) ලාභ සමච්ඡේදන ලක්ෂයේ දී ඒකක සහභාගය හා ඒකක විචල්‍ය පිරිවැය සමාන වේ.

(5) විකුණුම් මිල හා ස්ථාවර පිරිවැය ස්ථාවරව තිබිය දී ඒකක සහභාගය ඊශල යන විට වඩාත් ඉක්මනින් ලාභ සමච්ඡේදනය වේ.

**05.** 'X' භාණ්ඩයේ දී පහත තොරතුරු ලබා දී ඇත.

| | | | **රු.** |
|---|---|---|---|
| ඒකක විකුණුම් මිල | | | 50 |
| ඒකක විචල්‍ය පිරිවැය | - | ශ්‍රමය | 10 |
| | - | ද්‍රව්‍ය | 10 |
| | - | වෙනත් | 5 |
| මුළු ස්ථාවර පිරිවැය | | | 10 000 |

පහත දෑ ගණනය කරන්න.

| | ඒකක දායකය (රු.) | ලාභ සමච්ඡේදනය (ඒකක) | ලාභ / පරිමා අනුපාතය |
|---|---|---|---|
| (1) | 25 | 500 | 20% |
| (2) | 15 | 400 | 30% |
| (3) | 25 | 300 | 40% |
| (4) | 20 | 400 | 50% |
| (5) | 25 | 400 | 50% |

**06.** පහත වැරදි සූත්‍රය කුමක් ද?

(1) ලාභ සමච්ඡේදන ඒකක = $\frac{\text{ස්ථාවර පිරිවැය}}{\text{ඒකක සහභාගය}}$

(2) ලාභ සමච්ඡේදන විකිණුම් = $\frac{\text{ස්ථාවර පිරිවැය}}{\text{ලාභ පරිමා අනුපාතය}}$

(3) ලාභ පරිමා අනුපාතය = $\frac{\text{ඒකක ශුද්ධ ලාභය}}{\text{ඒකක විකුණුම් මිල}} \times 100$

(4) ඒකක දායකය = ඒකක විකුණුම් මිල - ඒකක විචල්‍ය පිරිවැය

(5) ඒකක දායකය = $\frac{\text{මුළු විකුණුම් - මුළු විචල්‍ය පිරිවැය}}{\text{ඒකක ගණන}}$

**07.** ඒකක විකුණුම් මිල රු. 100ක් ද ඒකක විචල්‍ය පිරිවැය රු. 60ක් ද වන අතර මුළු ස්ථාවර පිරිවැය රු. 20 000 කි. රු. 5 000 ක ලාභයක් ලැබීමට අවශ්‍ය විකුණුම් ඒකක ගණන,

(1) ඒකක 500 (2) ඒකක 625 (3) ඒකක 600

(4) ඒකක 650 (5) ඒකක 700

**08.** ඉහත ගැටලුවේ අපේක්ෂිත විකුණුම් ඒකක ගණන 650 ක් නම් ආරක්ෂක ආන්තිකය ඒකක

(1) 150 (2) 100 (3) 200 (4) 50 (5) 20

**09.** වැරදි ගණනය කිරීම කුමක් ද?

(1) ආරක්ෂක ආන්තිකය (රුපියල්) = මුළු විකුණුම් - ලාභ සමච්ඡේදන විකුණුම්

(2) ආරක්ෂක ආන්තිකය (ප්‍රතිශතය) = $\frac{\text{මුළු විකුණුම් - ලාභ සමච්ඡේදන විකුණුම්}}{\text{මුළු විකුණුම්}} \times 100$

(3) ආරක්ෂක ආන්තිකය (රුපියල්) = $\frac{\text{මුළු ලාභය}}{\text{ලාභ පරිමා අනුපාතය}}$

(4) ලාභය = මුලු දායකය – ස්ථාවර පිරිවැය

(5) ලාභ සමච්ඡේදනය (ඒකක) = $\frac{\text{ස්ථාවර පිරිවැය}}{\text{දායක විකුණුම් අනුපාතය}}$

**10.** පහත ප්‍රකාශයන්ගෙන් නිවැරදි ඒවා තෝරන්න. අන්සාධක ස්ථාවරව තිබිය දී

A - විකුණුම් මිල වැඩිවීමෙන් වඩා වේගයෙන් සමච්ඡේදනය වේ.

B - විකිණුම් මිල අඩුවීමෙන් වඩා වේගයෙන් සමච්ඡේදනය වේ.

C - ඒකක විචල්‍ය පිරිවැය වැඩිවීමෙන් ලාභ සමච්ඡේදන ඒකක ගණන අඩු වේ.

D - ඒකක විචල්‍ය පිරිවැය අඩුවීමෙන් ලාභ සමච්ඡේදන ඒකක ගණන අඩු වේ.

(1) A හා D (2) A හා B (3) A හා C

(4) B හා C (5) C හා D

**11.** 'x' භාණ්ඩයේ ඒකක විකුණුම් මල රු. 60 ක් වන අතර ඒකක විචලය පිරවැය රු. 40 ක් විය. මුළු ස්ථාවර පිරිවැය රු. 80 000 කි.
නව සැලසුම් ක්‍රියාත්මක කිරීම හේතුවෙන් විකුණුම් මිල රු. 20 කින් වැඩි කිරීමටත් , විචල්‍ය පිරිවැය 10% කින් වැඩි කිරීමටත් තම ප්‍රචාරණ වියදම් රු. 10 000 ක් දැරීමටත් සිදු වේ.
ලාභ සමච්ඡේදන ඒකක ගණන

| | **පැරණි** | **නව** |
|---|---|---|
| (1) | 4 000 | 3 000 |
| (2) | 4 000 | 4 000 |
| (3) | 3 500 | 2 500 |
| (4) | 2 500 | 4 000 |
| (5) | 4 000 | 2 500 |

**පහත තොරතුරු භාවිතා කරමින් ප්‍රශ්න අංක (12) සිට (15) දක්වා පිළිතුරු සපයන්න.**

එක්තරා භාණ්ඩයක් නිපදවන, නිෂ්පාදන සමාගමක 60% ක් පමණ සත්‍ය ක්‍රියාකාරී මට්ටමක් පැවතිණ. මෙම ක්‍රියාකාරී මට්ටම අනුව නිෂ්පාදනය කර විකිණීම වඩාත් ඵලදායී වේ. ඒකකයක විකුණුම් මිල රු. 40 ක් වන අතර ඒකක ආන්තික පිරිවැය රු. 24 කි. ස්ථාවර පිරිවැය රු. 120 000 කි.

**12.** සමච්ඡේදන ලක්ෂ්‍ය ඒකක ගණනින් සහ වටිනාකමින් කීය ද?

| | **ඒකක ගණන** | **වටිනාකම (රු.)** |
|---|---|---|
| (1) | 7 500 | 300 000 |
| (2) | 7 500 | 180 000 |
| (3) | 8 000 | 300 000 |
| (4) | 8 000 | 180 000 |
| (5) | 7 500 | 320 000 |

**13.** දායක විකුණුම් අනුපාතය

(1) 40% (2) 50% (3) 30% (4) 25% (5) 60%

**14.** රු. 40 000 ක ලාභයක් ලැබීමට අවශ්‍ය විකිණුම් ඒකක ගණන සහ විකුණුම් ආදායම,


| | **ඒකක ගණන** | **ආදායම (රු.)** |
|---|---|---|
| (1) | 12 000 | 400 000 |
| (2) | 8 000 | 350 000 |
| (3) | 10 000 | 350 000 |
| (4) | 10 000 | 400 000 |
| (5) | 8 000 | 400 000 |

**15.** ඒකකයක ආන්තික පිරිවැය රු. 30 දක්වා ද ස්ථාවර පිරිවැය රු. 150 000 දක්වා ද ඉහළ යන අතර රු. 30 000 ක ලාභයක් ලැබීමට අවශ්‍ය විකුණුම් ඒකක ගණන,

(1) 18 000 (2) 15 000 (3) 20 000

(4) 16 000 (5) 14 000

**ප්‍රශ්න අංක (16) සිට (25) දක්වා පිළිතුරු සැපයීමට පහත රූප සටහන යොදාගන්න.**



**16.** ස්ථාවර පිරිවැය රේඛාව වන්නේ,

(1) P (2) Q (3) R (4) S (5) D

**17.** මුළු විචල්‍ය පිරිවැය රේඛාව වන්නේ,

(1) P (2) Q (3) R (4) S (5) D

**18.** මුළු පිරිවැය රේඛාව වන්නේ,

(1) P (2) Q (3) R (4) S (5) D

**19.** මුළු ආදායම් රේඛාව වන්නේ,

(1) P (2) Q (3) R (4) S (5) H

**20.** ලාභ සමච්ඡේදන ලක්ෂ්‍යය වන්නේ,

(1) A (2) B (3) C (4) D (5) E

**21.** ආරක්ෂක ආන්තික ඒකක ප්‍රමාණය හා විකුණුම් අගය නිරූපණය වන්නේ පිළිවෙළින්,

(1) I හා K මඟින් (2) L හා I මඟින් (3) J හා H මඟින්

(4) H හා J මඟින් (5) K හා H මඟින්

**22.** ලාභ ප්‍රදේශය නිරූපණය වන්නේ,

(1) K මඟින් (2) I මඟින් (3) F මඟින්

(4) E මඟින් (5) J මඟින්

**22.** අලාභ ප්‍රදේශය නිරූපණය වන්නේ,

(1) K මඟින් (2) I මඟින් (3) J මඟින්

(4) K මඟින් (5) H මඟින්

**24.** ස්ථාවර පිරිවැය නිරූපණය වන්නේ,

(1) L මඟින් (2) K මඟින් (3) I මඟින්

(4) H මඟින් (5) J මඟින්

**25.** මුළු සහභාගය නිරූපණය වන්නේ,

(1) L මඟින් (2) K මඟින් (3) I මඟින්

(4) H මඟින් (5) J මඟින්